# කෘෂිකර්ම අමාත්‍යාංශය

# ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය

NLDB

## තනතුරු ඇබෑර්තු

පහත සඳහන් තනතුරු සඳහා යෝග්‍යතාපූර්ණ ශ්‍රී ලංකා පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුරු :**

**01. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයතනික මෙහෙයුම්) HM 1-3-2016**

**සුදුසුකම්** : කෘෂිකර්ම / වැවිලි කළමනාකරණය / පශු වෛද්‍ය විද්‍යාව / සත්ව පාලනය / කළමනාකරණ / රාජ්‍ය පරිපාලන / ව්‍යාපාර පරිපාලන / වාණිජ්‍ය පිළිබඳ උපාධියක් සමග පශ්චාත් උපාධියක් (මාස්ටර්ස්) හෝ පිළිගත් වෘත්තීය ආයතනයක සාමාජිකත්වය හෝ අධිසාමාජිකයා (Fellow)/ ICASL / CIMA / ACCA ආශ්‍රිත සාමාජිකත්වය

හා

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසුව සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ප්‍රත්‍යක්ෂ කළ හැකි සේවා වාර්තාවක් සහිතව කළමනාකාර මට්ටමේ අවම වශයෙන් වසර 18 ක සේවා පළපුරුද්ද තිබිය යුතු අතර, එයින් වසර 03 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ විය යුතුය.

**02. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පශු සම්පත් හා වැවිලි සංවර්ධන) HM 1-3-2016**

**සුදුසුකම්** : විද්‍යාව / කෘෂිකර්ම / වැවිලි කළමනාකරණය / පශු වෛද්‍ය විද්‍යාව / සත්ව පාලනය පිළිබඳ උපාධියක් සමග පශ්චාත් උපාධියක් (මාස්ටර්ස්) හෝ ඉහත ක්ෂේත්‍රයන්හි පිළිගත් වෘත්තීය ආයතනයක සාමාජිකත්වය

හා

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසුව සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ප්‍රත්‍යක්ෂ කළ හැකි සේවා වාර්තාවක් සහිතව කළමනාකාර මට්ටමේ අවම වශයෙන් වසර 18 ක සේවා පළපුරුද්ද තිබිය යුතු අතර, එයින් වසර 03 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ විය යුතුය.

**වැටුප** : HM 1-3-2016 : රු. 86,865/- - 15 x 2,270 - රු. 120,915/-

ඉහත වැටුපට අමතරව, රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.

**වයස** : අවුරුදු 35 ට අඩු නොවිය යුතු අතර, අවු. 50 ට වැඩි නොවිය යුතුය.

අයදුම් කිරීමේ ක්‍රියාවලිය අවස්ථාවේදී සමාන තත්ත්වයේ සේවය කර ඇති / සේවය කරන අයවලුන්ට ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

**අතිරේක ප්‍රතිලාභ :**

i. අභ්‍යන්තර (නේවාසික) හා බාහිර වෛද්‍ය ප්‍රතිලාභ

ii. සැතපුම් 960 ක පුද්ගලික ගමන් සහිතව පවරන ලද වාහනයක්

***සෑම අයදුම්කරුවෙකුම,***

i. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය

ii. තනතුරට අදාළ රාජකාරී හොඳින් ඉටුකිරීම හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය ශාරීරික හා මානසික යෝග්‍යතාවය

iii. අනර්ඝ චරිතයක් හෙබවිය යුතුය.

සියලු ජීව දත්ත, ලිපිනය හා දුරකථන අංකය ඇතුළත් තමා විසින් සකස් කරගන්නා වූ අයදුම්පත, සහතිකවල පිටපත් සමග, 2023 අප්‍රේල් 17 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි, සභාපති, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, අංක 40, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05 යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් යොමු කළ යුතුය.

**සභාපති,**
**ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය,**
**අංක 40, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.**